# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1756/29 - 2012 මැයි 04 වැනි සිකුරාදා - 2012.05.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**රේගු නිවේදනයයි**

රේගු ආඥා පනතේ (235 වැනි අධිකාරය) 101 වගන්තිය යටතේ වූ නියෝග

**ආනයනකරු තම භාණ්ඩ තම නැවෙන් ප්‍රවාහනය කළ විට රේගු වටිනාකම සඳහා ප්‍රවාහන පිරිවැය නිර්ණය කිරීම**

1. රේගු ආඥා පනතේ (235 වැනි අධිකාරය) 101 (1) (h) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙසේ කිරීමට අවශ්‍ය හා යෝග්‍ය බවට සෑහීමකට පත්වී මෙම නියෝග පනවමි. ආනයකරුවන් තම භාණ්ඩ තමන්ට අයත් නැව මගින් ශ්‍රී ලංකාවේ කිසියම් වරායකට ප්‍රවාහනය කළ විට, එම භාණ්ඩ සඳහා වූ රේගු වටිනාකම නිර්ණය කිරීම සඳහා රේගු ආඥා පනතේ 'ඉ' උප ලේඛණයේ 8.(1)(e)(i) වගන්තිය යටතේ දක්වා ඇති පරිදි, ප්‍රවාහනය කිරීමේ පිරිවැය ලෙස එම භාණ්ඩවල නැව තෙක් වියදම් සංචිතය (නැවිස) (FOB) මිළෙන් 15%ක් ගත යුතු බවට මෙයින් නියම කරමි.

2. මෙම නියෝග, රේගු වටිනාකම සඳහා වන 2012(1) නියෝග ලෙස හඳුන්වනු ලබන අතර, 2012 මැයි 04 වැනි දින සිට ක්‍රියාත්මක වන්නේය.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය.

2012 අප්‍රේල් මස 18 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ දී ය.

05 - 519


1A - G 015993 — 485 (2012/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.